අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
චක්‍රලේඛ අංකය : 1995/25

මගේ අකංය: 2/පාසං/02/08
පාසල් කටයුතු ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1995. 09. 12 වන දින

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු වෙත.

## පාසල් ළමුන් ප්‍රසිද්ධ උත්සව වලට සහභාගි කරවීම සහ පාසල් තූර්යවාදක කණ්ඩායම් ප්‍රයෝජනයට ගැනීම.

ඉහත සඳහන් කාරණයට අදාලව මා විසින් මීට පෙර නිකුත් කර ඇති 133/77 සහ 1977.08.12 දරන චක්‍රලේඛයටත්, අංක 2/ක්‍රිවිබා/3/18 සහ 1984. 08. 15 දින චක්‍රලේඛයටත් සමාංක හා 1985. 12. 30 අංක 10 දරන චක්‍රලේඛයටත් ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

02 මෙම චක්‍රලේඛවලින් පාසල් ළමුන් උත්සවවලට සහභාගි කරවීම හා පාසල් තූර්ය වාදක කණ්ඩායම් ප්‍රයෝජනයට ගැනීම පිළිඳව පහත සඳහන් උපදෙස් දී ඇත.

(1) නොයෙක් උත්සව වලට පැමිණෙන අමුත්තන් පිළිගැනීම සඳහා පාසල් ළමුන් මග දෙපස පෙල ගැස්වීම, අචාර පෙලපාලි පැවැත්වීම හා පාසල් භූමියෙන් පිටත තූර්ය වාදක කණ්ඩායම් පාවිච්චියට ගැනීම එම චක්‍රලේඛවලින් තහනම් කොට ඇත. පාසල් ළමුන් ප්‍රසිද්ධ උත්සවවලට සහභාගි කරවීමත්, පාසල් තූර්ය වාදක කණ්ඩායම් සහභාගි කර වීමත්, පහත සඳහන් අවස්ථාවලට පමණක් සීමා කළයුතු බව එම චක්‍රලේඛ මගින් අවධාරණය කර ඇත.

1 තමාගේ පාසලේ පවත්වන උත්සව
2 රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සංවිධානය කරනු ලබන අධ්‍යාපන උත්සව.

උදා i ජාතික/පළාත් ක්‍රීඩා උළෙල

ii ජාතික මට්ටමේ/පළාත් මට්ටමේ සංස්කෘතික උත්සව.
මෙම උත්සව සංස්කෘතික දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය සංවිධානය කරන ඒවා විය යුතුය.

iii රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකහත්වය ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සංවිධානය කරනු ලබන නිදහස් උත්සව.

iv අතිගරු ජනාධිපතිනිය හෝ ගරු අගමැතිනිය සහභාගි වන රේඛීය අමාත්‍යාංශය/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/හෝ රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සංවිධානය කරනු ලබන උත්සව.

v විදේශ රාජ්‍ය නායකයන් සහභාගි වන උත්සව.

මෙයට පෙර නිකුත් කරන ලද චක්‍රලේඛවලින් එනවා ඇති ඉහත සඳහන් කොන්දේසි උල්ලංඝනය වන පරිදි පාසල් ළමුන් විවිධ උත්සව, පිළිගැනීම ආදියට සහභාගි කිරීමත්, පාස් තූර්ය වාදක කණ්ඩායම් ප්‍රයෝජනයට ගැනීමත් සිදුවන බවට ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පැමිණිලි ලැබී ඇත.

පෙර සඳහන් චක්‍රලේඛවලින් දී ඇති උපදෙස් ඒ අන්දමින් ම තරයේ පිළිපදින ලෙස සියළුම විදුහල්පතිවරුනට උපදෙස් දෙන ලෙස මෙයින් දන්වා සිටිමි. මෙම චක්‍රලේඛයේ නියමයන් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සෘජුව පාලනය වන ජාතික පාසල්වලට මෙන්ම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලින් පාලනය වන පාසල්වලටට එකසේ බලාපන බව අවධාරනය කරනු කැමැත්තෙමි. කවර හේතුවක් නිසා හෝ මෙම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය නොකළ යුතු බව දන්වමි.

එම්. ඩී. ඩී. පීරිස්,
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්

1 ජනාධිපති ලේකම්.
2 අග්‍රාමාත්‍ය ලේකම්.
3 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්.
4 සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
5 සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරු.
6 සියළුම දිසා ලේකම්වරු